පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය-ව්‍යාපාර අධ්‍යයනය

සතිය - 6

ශ්‍රේණිය-12

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

නිපුණතාව 1.0 - ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.

නිපුණතා මට්ටම 1.6 - ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන ව්‍යාපාර පරිසරය වර්ග කරයි.

- ව්‍යාපාර පරිසරය - ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරන සාධක ක්‍රියාත්මක වන පරිසරයයි.

- ව්‍යාපාර පරිසරය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.
  1.අභ්‍යන්තර පරිසරය
  2.බාහිර පරිසරය

- අභ්‍යන්තර පරිසරය - සංවිධානය තුළ සිටින එයට බලපෑම් කරන කණ්ඩායම් හා තත්ත්ව

- බාහිර පරිසරය - ව්‍යාපාරයට බලපෑම් කරන ව්‍යාපාර ආයතනයට පිටතින් ඇති සියලුම දේ.

<u>අභ්‍යාස</u>

1.බාහිර පරිසරයට අයත් ආසන්න පරිසරය යන්න හඳුන්වා උදාහරණ 3ක් දෙන්න.
2. බාහිර පරිසරයට අයත් සාර්ව පරිසරය යන්න හඳුන්වා උදාහරණ 3ක් දෙන්න.
3.ව්‍යාපාර පරිසරය අධ්‍යයනයෙන් ව්‍යාපාරිකයෙකුට අත්වන ප්‍රයෝජන මොනවාද?